මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01. இலங்கை.

The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/CIR/2025/Research

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025.04.21

කළමනාකරණ සේවා චක්‍රලේඛ: 02/2014(I)

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල සහ

සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

## 2025 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම්

2025 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිමට අදාළව "රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය - 2025" යන මැයෙන් යුතුව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක අමප 25/0516/804/064 හා 2025.03.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2025.03.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලැබී ඇති අනුමැතියට අනුකූලව "2014 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම" යන මැයෙන් නිකුත් කර ඇති 2014.02.11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 හි 02 වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"රජයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් හා විශ්වවිද්‍යාල නිලධාරීන්ට ගෙවන ලද දීමනා රහිත මූලික වැටුපෙන් 35% ක් වූ පර්යේෂණ දීමනාව 2025 නව වැටුප් සංශෝධනයට අනුකූලව 2025.04.01 දින සිට දීමනා රහිත මූලික වැටුපෙන් 21% ක් ලෙස සංශෝධනය කරනු ලැබේ. මෙම දීමනාවට විශ්‍රාම වැටුප් හෝ ව්‍යවස්ථාපිත දීමනා හිමිකම් නොමැත."

02. එම චක්‍රලේඛයේ 03 වන වගන්තිය අනුව සුදුසුකම් ලබන නිලධාරින් සඳහා පර්යේෂණ දීමනාව ගණනය කිරීමේ දී අදාළ කරගත යුතු වැටුප් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| නිලධාරී වර්ගය | 2025.04.01 දින සිට ගෙවිය යුතු ආකාරය |
|---|---|
| රාජ්‍ය අංශයේ නිලධාරීන් | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන (II) හි සඳහන් වැටුප |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල නිලධාරීන් | කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි උපලේඛන (I) හි සඳහන් වැටුප |
| විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය | කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 හි උපලේඛන (I) හි සඳහන් වැටුප |

03. උක්ත දීමනාව ලබාදීමේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2014 හි 4 වගන්තියේ ඇතුළත් ක්‍රමවේදය නිසි පරිදි අනුගමනය කරන බවට තහවුරු කරගත යුතු අතර එම ක්‍රමවේදයට පරිබාහිර වෙනත් ක්‍රමවේදයන් මෙම දීමනාව ලබාදීම සඳහා අදාළ කර නොගත යුතුය.

04. කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2014 හි සඳහන් අනෙකුත් කොන්දේසි තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

ඒ.කේ. සෙනෙවිරත්න
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම් (වැ.බ.)

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
4. ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
5. ලේකම්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
6. ලේකම්, කෘෂිකර්ම , පශු සම්පත් , ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
7. විගණකාධිපති